# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**2046/3 – 2017 නොවැම්බර් මස 20 වැනි සඳුදා – 2017.11.20**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2017 නොවැම්බර් මස 21 වැනි දින සිට ආරම්භ වන මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2017.06.06 දිනැති අංක 2022/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් සංයෝජිත වර්ගීකරණ අංක 1517.10.30 සහ 1517.10.90 යටතේ වන මාජරින් සඳහා ප්‍රකාශිත අදාල නියමය 2017 නොවැම්බර් මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 නොවැම්බර් මස 20 වන දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 01 | 07.03 | 0703.10.10 | රතු ළූනු | කි. ග්‍රෑමයට රු. 25 |
| 02 | 08.04 | 0804.10.10 | රට ඉඳි - අළුත් | කි. ග්‍රෑමයට රු. 60 |
| | | 0804.10.20 | රට ඉඳි - වියළි | කි. ග්‍රෑමයට රු. 60 |
| 03 | 08.06 | 0806.20 | මිදි - වියළි | කි. ග්‍රෑමයට රු. 230 |
| 04 | 09.09 | 0909.31 | සූදුරු බීජ - කුඩු නොකළ හා නොඇඹරූ | කි. ග්‍රෑමයට රු. 162 |
| | | 0909.32 | සූදුරු බීජ - කුඩු කළ හා ඇඹරූ | කි. ග්‍රෑමයට රු. 162 |
| 05 | | 0909.61.20 | මහදුරු බීජ | කි. ග්‍රෑමයට රු. 162 |
| 06 | 15.17 | 1517.10.30 | මාජරීන් - අනෙකුත් මේද ප්‍රතිශතය 80% හෝ ඊට වැඩි | කි. ග්‍රෑමයට රු. 215 |
| | | 1517.10.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 315 |

12 - 95

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.